**COVID-19 වසංගතය මැඩ පැවැත්වීම සඳහා විදේශික ගෘහස්ථ සේවක/සේවිකාවන්, සේවා යෝජකයින් සහ රැකියා නියෝජිත ආයතන සඳහා වන උපදෙස් මාලාව**

විදේශික ගෘහස්ථ සේවක/සේවිකාවන් (FDHs)

- පිරිස් වශයෙන් එක්රැස්වීම් තහනම් කිරීම සහ මුහුණු ආවරණ පැළඳීම පිලිබඳ නියාමනයන්ට අනුගත වීම.
- විවේක දිනයන් වල හැකිතාක් දුරට නිවසට වී විවේක ගැනීම. ජන අධික ස්ථාන (නේවාසිකාගාර ඇතුළුව) වල රැඳී සිටීමෙන්, පුද්ගලයින් අතර ආහාර බෙදා ගැනීමෙන්, නිවසින් පිටතට යාමේදී එක්ව ආහාර ගැනීමෙන් වැළකීම.

FDH සේවා යෝජකයින්

- සමාජ දුරස්ථභාවය සුරැකීම සහ හැකිතරම් නිවෙස් වල සමාජ එක්රැස්වීම් වලින් වැළකීසිටීම.
- FDHs සමඟ විවේක දිනය යොදාගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම.
- කාරුණික වීම සහ FDHsගේ අවශ්‍යතා පිළිබඳව අවබෝධය පෙන්වීම.

රැකියා නියෝජිත ආයතන

- FDHs හට නේවාසිකාගාර වල රැස් වීමට අවස්ථා සකස් නොකිරීම
- සෞඛ්‍ය ආරක්ෂාව සඳහා වූ මධ්‍යස්ථානය මඟින් නිවේදනය කර ඇති පෞද්ගලික සනීපාරක්ෂාව සහ සමාජ දුරස්ථභාවය පිලිබඳ සෞඛ්‍ය උපදෙස් වලට අනුගත වීම, නේවාසිකාගාර පහසුකම් පිරිසිදුව පවත්වාගෙන යාම සහ යහපත් පාරිසරික සනීපාරක්ෂාවක් පවත්වාගෙන යාම.
- අසාදිත බවට තහවුරු වූ අයගේ සම්බන්ධතා ලුහුබැඳීම සඳහා නේවාසිකාගාර පහසුකම් පරිහරණය කල හෝ නේවාසිකාගාර වලට ගොඩ වැදුණු FDHsගේ ලැයිස්තුවක් පවත්වාගෙන යාම.
- නේවාසිකාගාරවල නැවතී සිටින FDHs හට තමන්ගේ පෞද්ගලික සනීපාරක්ෂාවට අවධානය යොමුකරන ලෙස සහ සමාජ දුරස්ථභාවය රකින ලෙස සිහිපත් කිරීම.

COVID-19 පිලිබඳ නවතම තොරතුරු සඳහා, රජයේ COVID-19 තේමාන්විත වෙබ් අඩවිය වෙත පිවිසෙන්න. (www.coronavirus.gov.hk)

විමසීම්

විදේශීය ගෘහස්ථ සහායකයින් සඳහා විශේෂිත දුරකථන අංකයක්: 2157 9537 (මෙහෙය වන්නේ “1823” විසිනි)
විද්‍යුත් තැපැල: fdh-enquiry@labour.gov.hk
අන්තර්ජාල විමසීම්: www.fdh.labour.gov.hk